සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

**81 | S | I**

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 11 - 2018

විභාග අංකය .................................... **කෘෂි හා ආහාර තාක්ෂණය - I** **කාලය පැය එකයි**

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. මෑත කාලයේදී ශ්‍රී ලංකාවේ දේශීය ආහාර වර්ග ප්‍රචලිත කිරීම සඳහා නැඹුරුතාවක් දක්වයි. පහත දැක්වෙන බෝග කාණ්ඩ අතරින් දේශීය ආහාර වර්ග ඇතුළත් කාණ්ඩය කුමක්ද?
   I. කුරක්කන්, බාර්ලි හා සෝයා බෝංචි
   II. පැරණි වී වර්ග, කුරක්කන් හා බඩ ඉරිඟු
   III. පැරණි වී වර්ග, තිරිඟු හා බාර්ලි
   IV. තිරිඟු මෙනේරි හා සෝයා බෝංචි

2. ශාක කුල කීපයකට අයත් බෝග සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
   A. බටු මිරිස්, හා තක්කාලි සොලනේසි කුලයට අයත් බෝග වේ.
   B. ග්‍රැමිනේ කුලයේ ශාකවල, මූල ගැටිති තුල නයිට්‍රජන් තිරකරන බැක්ටීරියා ජීවත්වේ.
   C. කුකර්බිටේසි කුලයේ බොහොමයක් බෝග වැල් ආකාරයට වර්ධනය වේ.
   ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,
   I. A හා B ය II. A හා C ය III. B හා C ය IV. B පමණි

3. තවාන් පැළ අතර අර්ධව පිලිස්සූ දහයියා ඇතිරීමෙන් පාලනය කරගත හැකි දිලීර රෝගයකි,
   I. දියමලන් කෑමය
   II. ඇන්ත්‍රැක්නෝස්ය
   III. හිටුමැරීමය
   IV. කොළකොඩවීමය

4. බෝග වගාවට හිතකර වඩාත් සුදුසු පාංශු ජල තත්ත්වය වන්නේ,
   I. ගුරුත්වාකර්ෂණ ජලයයි
   II. ජලාකර්ෂණ ජලයයි
   III. කේෂාකර්ෂණ ජලයයි
   IV. භූගත ජලයයි

5. බෝගයක් සිට වූ පසු එම බෝගය සිට වූ පසට කෙරෙන සියලුම කාර්යයන් හඳුන්වනු ලබන්නේ,
   I. පශ්චාත් සාත්තු ලෙසය
   II. අතුරුයත් ගෑම ලෙසය
   III. මූලික බිම් සැකසීම ලෙසය
   IV. බෝග රැකබලා ගැනීම ලෙසය

6. වෛරස් රෝග වලින් තොර පැළ ලබාගැනීම සඳහා වඩාත්ම යෝග්‍ය ශාක ප්‍රචාරණ ක්‍රමය වන්නේ,
   I. පටක රෝපණයෙන් පැළ ලබා ගැනීමයි
   II. බීජ මගින් පැළ ලබා ගැනීමයි
   III. බද්ධ කිරීමෙන් පැළ ලබා ගැනීමයි
   IV. ලේයර් කිරීමෙන් පැළ ලබා ගැනීමයි

7. විවිධ සාධකවල බලපෑම නිසා මාතෘ පාෂාණය ජීර්ණය වී මාතෘ ද්‍රව්‍ය සෑදෙයි. මෙම මාතෘ ද්‍රව්‍ය පාංශු පැතිකඩෙහි කුමන කලාපයේ (ස්තරයේ) දක්නට ලැබේද?
   I. A කලාපයේ II. B කලාපයේ III. C කලාපයේ IV. O කලාපයේ

8. ගල් මුල් සහිත විශාල ඉඩමක පස පෙරලීම සහ කැට පොඩි කිරීම සඳහා යෝග්‍ය කෘෂි උපකරණ පිළිවෙලින් දක්වා ඇත්තේ,
   I. තැටි නගුල හා කොකු නගුලයි
   II. තැටිපෝරුව හා හැඩලැලි නගුලයි
   III. රොටවේටරය සහ තැටි නගුලයි
   IV. ජපන් පරිවර්ත්‍ය නගුල හා ගොවි පෝරුවයි

9. අවුරුද්දේ කුමන කාලයක වගාකලත් නියමිත වයසේදීම පීදීම සිදුවන බෝග නම්,
   I. කෙටි දින බෝගය
   II. දිගු දින බෝගය
   III. ප්‍රභා අවධි සංවේදී බෝගය
   IV. දින උදාසීන බෝගය

10. වර්තමානයේ ශ්‍රී ලංකාවේ පාංශු ඛාදනයට හේතුවන ප්‍රධාන සාධකය වන්නේ,

I. මුහුදු ජලයයි  III. ගලායන ජලයයි
II. මිනිස් ක්‍රියාකාරකම්ය  IV. වේගවත් සුළඟයි

11. ආර්ද්‍රතාවය නිතර වෙනස්වීමකට ලක්වන්නේ,

I. උෂ්ණත්වය හා ආලෝකය නිසාය  III. සුළඟ හා ආලෝකය නිසාය
II. උෂ්ණත්වය හා සුළඟ නිසාය  IV. සුළඟේ වේගය හා ආලෝකය නිසාය

12. දිවයින පුරා වැසි ලැබෙන පළමුවන අන්තර් මෝසම් ආරම්භ වන කාල සීමාව වන්නේ,

I. මාර්තු - අප්‍රේල්ය  III. ඔක්තෝබර් - නොවැම්බර්ය
II. මැයි - සැප්තැම්බර්ය  IV. දෙසැම්බර් - පෙබරවාරිය

13. බෝග වගාවට සුදුසු පසක තිබිය යුතු පාංශු සංඝටක ප්‍රතිශතය නිවැරදිව දක්වෙන්නේ,

I. ජලය 25% වාතය 25% ඛනිජ 45% කාබනික ද්‍රව්‍ය 5%
II. ජලය 45% වාතය 25% ඛනිජ 5% කාබනික ද්‍රව්‍ය 25%
III. ජලය 25% වාතය 45% ඛනිජ 25% කාබනික ද්‍රව්‍ය 5%
IV. ජලය 5% වාතය 5% ඛනිජ 45% කාබනික ද්‍රව්‍ය 25%

14. W. L. යන සංකේතයෙන් හඳුන්වනු ලබන දේශගුණික කලාපය වන්නේ,

I. උඩරට තෙත් කලාපයයි  III. පහතරට තෙත් කලාපයයි
II. මැද රට තෙත් කලාපයයි  IV. උඩරට අතරමැදි කලාපයයි

15. පස් සාම්පලයක PH අගය පරීක්ෂා කළ ශිෂ්‍යයෙක් එහි අගය 5.6 ලෙස සටහන් වී ඇති බව දක්නා ලදී. ඒ අනුව මෙම පස් වර්ගය අයත්වන්නේ,

I. ප්‍රබල ආම්ලික පසකටය  III. උදාසීන පසකටය
II. ආම්ලික පසකටය  IV. භාෂ්මික පසකටය

16. ශාක වර්ධන විලාශය අනුව පැළෑටි, පඳුරු හා ගස් වශයෙන් බෝග වර්ගීකරණය කරයි. මේ අනුව පඳුරු වර්ගයට පමණක් අයත්වන බෝග කාණ්ඩය කුමක්ද?

I. බණ්ඩක්කා, අන්නාසි, මිරිස්  III. පොල්, රඹුටන්, තේක්ක
II. කෝපි, දෙළුම්, කුරුඳු  IV. කව්පි, මෑ, මුං

17. පැළ අතර වැඩි පරතරයක් අවශ්‍යවන බෝග සංස්ථාපනය සඳහා තනි වගාවලවල් යොදා ගැනේ. පොල් වගාවේදී නිර්දේශිත පරතරය වන්නේ,

I. මීටර් 2 x 2  II. මීටර් 4 x 4  III. මීටර් 6 x 6  IV. මීටර් 8 x 8

18. මෙම රූප සටහනේ පෙනෙන ආකාරයට බෑවුම් සහිත ඉඩම්වල වගා කිරීම හඳුන්වනු ලබන්නේ,

I. කඩින් කඩ වගාව ලෙසය  III. සමෝච්ච වගාව ලෙසය
II. කට්ටි වගාව ලෙසය  IV. හෙල්මළු වගාව ලෙසය

19. භ්‍රමණ පෝරුව යනුවෙන් හඳුන්වන ද්විතියික බිම සැකසීමේ උපකරණය වන්නේ,

I. තල පෝරුවයි  III. රොටවේටරයයි
II. අත් පෝරුවයි  IV. දැති පෝරුවයි



20. නෙරිදෝකෝ තවානක බීජ සිටුවීම සඳහා කුට්ටිවලමැද සිදුරක් බැගින් සාදා බීජ තවාන් දමනු ලබයි. කුඩා බීජ හා විශාල බීජ සඳහා මෙම සිදුරේ ගැඹුර පිළිවෙළින් දක්වෙන්නේ,

I. මිලි මීටර් 6 හා මිලි මීටර් 12 ය
II. මිලි මීටර් 4 හා මිලි මීටර් 10 ය
III. මිලි මීටර් 2 හා මිලි මීටර් 8 ය
IV. මිලි මීටර් 1 හා මිලි මීටර් 6 ය

21. වගාවක් සඳහා ඇලි ජලසම්පාදනය හෝ බිංදු ජල සම්පාදනය හෝ භාවිතය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

I. ඇලි ජලසම්පාදනය සඳහා වැඩි ප්‍රාග්ධනයක් අවශ්‍ය වේ.
II. වගා භූමියේ ඉඩ කඩෙන් වැඩිපුරම ප්‍රයෝජනයට ගත හැක්කේ ඇලි ජල සම්පාදනයෙනි.
III. ජලය කාර්යක්ෂවම ප්‍රයෝජනයට ගත හැක්කේ බිංදු ජල සම්පාදනයෙනි.
IV. බිංදු ජල සම්පාදනය සඳහා අඩු තාක්ෂණික දැනුමක් වුවද ප්‍රමාණවත්ය.

22. අතිරික්ත ජලය වගා ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීම හඳුන්වන්නේ,

I. ජල සම්පාදනයයි.
II. ජල වහනයයි.
III. පාංශු ජල සංරක්ෂණයයි.
IV. උත්ස්වේදනයයි.

23. ශාකවල ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය සඳහා වැදගත් වන වර්ණාවලිය පිළිවෙළින් දක්වා ඇත්තේ,

I. රතු හා දම් ආලෝකයයි.
II. නිල් හා දම් ආලෝකයයි.
III. නිල් හා රතු ආලෝකයයි.
IV. රතු හා ඉන්ඩිගෝ ආලෝකයයි.

24. ඩැපොග් තවානකින් පැළ ගැලවීමට වඩාත් සුදුසු,

I. දින 10 - 14 දීය
II. දින 14 - 16 දීය
III. දින 8 - 10 දීය
IV. දින 14 - 20 දීය

25. ශාකයක පත්‍රදාර කහපාට වීම හා පිලිස්සුණු ස්වභාවයක් ගැනීම සිදුවන්නේ පහත සඳහන් කුමන පෝෂක ඌනතාවය නිසාද?

I. නයිට්‍රජන්ය
II. පොටැසියම්ය
III. පොස්පරස්ය
IV. සල්පය

26. බෝග වගාවේදී පැළ අතර නිසි පරතරයක් පවත්වා ගැනීම සශ්‍රීක වගාවක් ලබාගැනීමට හේතුවේ බෝග හා පැළ අතර පරතරය තීරණය කරන සාධකය නම්,

I. බෝගයේ වයසය
II. බෝගයේ පත්‍ර විහිදෙන දුරය
III. බෝගයේ මුල් විහිදෙන දුරය
IV. බෝගයට ජලසම්පාදනය කරන ක්‍රමය ය

27. බෝගයක මල් පිපෙන හා ඵල දරන අවස්ථාවකදී යෙදීමට වඩාත් සුදුසු පොහොර වර්ගයකි,

I. යූරියා
II. මියුරේට් ඔෆ් පොටෑෂ්
III. ඩොලමයිට්
IV. ඇමෝනියම් සල්ෆේට්

28. පූර්ණ පොහොර මිශ්‍රණයක අඩංගු වන ප්‍රධාන පෝෂක වන්නේ,

I. නයිට්‍රජන්, පොස්පරස්, පොටැසියම්ය.
II. නයිට්‍රජන්, පොටැසියම්, මැග්නීසියම්ය.
III. පොස්පරස්, පොටැසියම් හා සල්පය.
IV. නයිට්‍රජන්, සල්ප, මැග්නීසියම්ය

29. කොම්පෝස්ට් පොහොර නිපදවීමේදී පිදුරු යෙදීමෙන් බලාපොරොත්තු වන්නේ,

I. පොස්පරස් වැඩිකර ගැනීමටය.
II. නයිට්‍රජන් වැඩිකර ගැනීමටය.
III. පොටැසියම් වැඩිකර ගැනීමටය.
IV. මැග්නීසියම් වැඩිකර ගැනීමටය.

30. ඇතැම් වල් පැළෑටි මනුෂ්‍ය ආහාර ලෙස ද යොදා ගනී. එසේ ආහාරයට ගනු ලබන වල්පැළෑටි කාණ්ඩය වන්නේ,

I. බැලතණ, ගිරාපලා, උඳුපියලිය.
II. කිරිහැන්ද, ගිරාපලා, දියහබරල
III. දිය හබරල, බැලතණ, ජපන් ජබර
IV. මානා, කිරිහැන්ද, ගිරාපලා

31. පුල්ලි ඇතිවීම, අංගමාරය මෘදුකුණුවීම ආදී රෝග ලක්‍ෂණ පෙන්නුම් කරනුයේ,
   I. වෛරස් රෝගවලය.
   II. බැක්ටීරියා රෝග වලය.
   III. වටපනු රෝග වලය.
   IV. ෆ්‍රායිටොප්ලාස්මා රෝගවලය.

32. A - රෝග කාරක සහමුලින්ම තුරන් කිරීම
   B - වගාබිමට රෝග කාරක ඇතුළුවීම පාලනය කිරීම
   C - රෝග කාරක වල අහිතකර පරිසර තත්ව නිර්මාණය කිරීම
   D - නිතර දිලීර නාශක ඉසීම
   ඉහත ක්‍රියාමාර්ග අතුරෙන් ශාක රෝග පාලනය කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රමය වන්නේ,
   I. A හා B ය   II. A හා C ය   III. B හා C ය   IV. C හා D ය

33. වී වගාවේ පරාගනය සම්බන්ධව වඩාත්ම නිවැරදි ප්‍රකාශය වන්නේ,
   I. වී පුෂ්පය 99% ස්ව පරාගනය වේ.
   II. වී පුෂ්පය 99% පර පරාගනය වේ.
   III. වී පුෂ්පය 50% ස්ව පරාගනය හා 50% පර පරාගනය වේ.
   IV. වී පුෂ්පය 60% ස්ව පරාගනය හා 40% පර පරාගනය වේ.

34. බතලගොඩ වී අභිජනන මධ්‍යස්ථානය මගින් ගොවීන්ට පළමුව හඳුන්වාදුන් දෙමුහුන් වී ප්‍රභේදයකි.
   I. B.G. 300   II. H - 4   III. B.W. 351   IV. B.G. 450

35. දුඹුරු පැළ කීඩෑ උවදුරට ප්‍රතිරෝධී වී ප්‍රභේදයක් වන්නේ,
   I. B.G. 300   II. B.G. 450   III. B.G. 3-5   IV. B.W. 351

36. වී වල අස්වනු නෙළීමට සුදුසුම අවස්ථාව ලෙස සැලකෙන්නේ,
   I. මේරූ කරල් වලින් 65% ක් රන්වන් පාට වීමය.
   II. මේරූ කරල් වලින් 75% ක් රන් වන්පාට වීමය.
   III. මේරූ කරල් වලින් 85% ක් රන්වන් පාට වීමය.
   IV. මේරූ කරල් වලින් 95% ක් රන්වන් පාට වීමය.

37. ඒකබීජ පත්‍රී බීජවල ප්‍රරෝහණයට අවශ්‍ය ආහාර සංචිත වී ඇත්තේ,
   I. බීජ පත්‍ර තුළය.
   II. බීජ මූලය තුළය.
   III. බීජාවරණයේය.
   IV. භ්‍රෑණපෝෂය තුළය.

38. සිටුවීම සඳහා යෝග්‍ය බීජවල තිබිය යුතු ප්‍රවේණික පාරිශුද්ධතාවය යනුවෙන් අදහස් කරන්නේ,
   I. අපද්‍රව්‍ය වලින් තොර බීජවීම
   II. එකම ප්‍රභේදයේ බීජවීම
   III. බොල් බීජ වලින් තොරවීම
   IV. වල් පැළෑටි වලින් තොරවීම

39. ශාක බද්ධයක් සඳහා අනුජය තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
   A - ශක්තිමත් මූල මණ්ඩලයක් ඇති ශාකයකින් ලබාගත යුතුයි.
   B - උසස් ගුණාත්මක බවින් යුතු මව් ශාකයකින් ලබාගත යුතුයි.
   C - ග්‍රාහක ශාක අයත් කුලයේම ශාකයකින් ලබාගත යුතුයි.
   මෙයින් නිවැරදි ප්‍රකාශය වන්නේ,
   I. A හා B ය
   II. A හා C ය
   III. B හා C ය
   IV. A, B හා C සියල්ලම

40. නිර්පාංශු වගාවේ රෝපණ මාධ්‍යක තිබියයුතු ලක්‍ෂණයක් ලෙස ස්වාරක්‍ෂක ගුණය වැදගත් වේ. ස්වාරක්‍ෂක ගුණය ලෙස සැලකෙන්නේ,
   I. මනා වාතනයක් පැවතීමය
   II. මනා ලෙස ජලවහනය සිදුවීමය
   III. පළිබෝධවලින් තොරවීමය
   IV. PH අගය බෝගයට හිතකර ලෙස පැවතීමය

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

81 S II

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 11 - 2018

විභාග අංකය .................................... කෘෂි හා ආහාර තාක්ෂණය - II කාලය පැය දෙකයි

★ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
★ පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.

01. වර්තමානයේ ශ්‍රී ලංකාවේ සියලුම පාසල්වල ක්‍රියාත්මක කරන තිරසර සංවර්ධන වැඩ සටහන යටතේ පාසල් ගෙවතු ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම අනිවාර්ය කටයුත්තකි. ඒ තුළින් පාසල් දරුවන්ට බෝග වගාව සඳහා භූමිය තෝරාගැනීමේ සිට අස්වනු සැකසීම දක්වා වූ සියලු කාර්යයන් පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීමට හැකිවේ.

I. පාසල් ගෙවත්තක මූලික බිම් සැකසීම සඳහා භාවිත කළහැකි උපකරණ 02 ක් නම් කරන්න.

II. සොලනේසියේ හා කුකර්බිටේසියේ කුලවලට අයත් බෝග වර්ග 02 ක් බැගින් පිළිවෙළින් ලියන්න.

III. උස් පාත්තියක සම්මත දිග හා පළල පිළිවෙළින් ලියන්න.

IV. වැලි අධික පසක් බෝග වගාවට සුදුසු තත්වයට පත්කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග 02 ක් දක්වන්න.

V. වැලි අධික පසක බෝග වගා කිරීමේදී මතුවන ගැටලු 02 ක් සඳහන් කරන්න.

VI. ගෙවතු වගාවේදී බෝගවලට හානිකරන කෘමීන් නොවන පළිබෝධකයින් දෙදෙනෙක් නම් කරන්න.

VII. වගා ක්ෂේත්‍රයක රෝග කාරක ගහණය අඩු කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග 02 ක් දක්වන්න.

VIII. පාසල් ගෙවත්තක වසුන් ලෙස භාවිත කළ හැකි ද්‍රව්‍ය 02 ක් සඳහන් කරන්න.

IX. ගෙවතු වගාවේදී වසුන් යෙදීමෙන් ඇති වන ප්‍රයෝජන 02 ක් ලියන්න.

X. බෝග වගාවේදී භාවිත කළ හැකි පරිසර හිතකාමී බඳුන් වර්ග 02 ක් සඳහන් කරන්න.

02. අතීතයේ මෙන්ම වර්තමානයේ දී ද ශ්‍රී ලංකාව තුළ වැසි ජලය සංරක්ෂණය සඳහා රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන මගින් විශාල අනුග්‍රහයක් දක්වයි.

I. a) වැසි ජලය රැස්කිරීමේ වාසි 02 ක් නම් කරන්න.
b) බෝග වගාවේදී භාවිත කරන ඉතාම කාර්යක්ෂම හා සූක්ෂම ජලසම්පාදන ක්‍රමය හඳුන්වන්න.
c) උප පෘෂ්ඨීය ජලසම්පාදන ක්‍රමයේ වාසි 02 ක් සඳහන් කරන්න.

II. a) පාංශු ජලය ඉවත්වන ක්‍රම 02 ක් දක්වන්න.
b) පාංශු ජලය සංරක්ෂණය කළ හැකි ආකාර 02 ක් දක්වන්න.

III. a) කෘෂි කර්මාන්තයේදී දුර්වල ජලවහනය නිසා ඇතිවන ගැටලු 02 ක් දක්වන්න.
b) ඔබේ නිවසේ වහළය මත වැටෙන වර්ෂා ජලය එක් රැස්කර ගැනීම සඳහා සුදුසු ක්‍රමයක් යෝජනා කරන්න.

03. කෘෂි කර්මාන්තයේදී බෝග ඵලදායිතාව වැඩිකර ගැනීම සඳහා පළිබෝධ පාලනය මැනවින් සිදුකළ යුතුයි.
I. a) පළිබෝධ යන්න නිර්වචනය කරන්න.
b) වල්පැළෑටිවල දක්නට ලැබෙන පොදු ලක්ෂණ 02 ක් සඳහන් කරන්න.
c) ආක්‍රමණශීලී වල් පැළෑටි 02 ක් දක්වන්න.

II. a) බැක්ටීරියා රෝගවල දැකිය හැකි පොදු ලක්ෂණ 04 ක් ලියන්න.
b) සොලනේසියේ හා කුකර්බිටේසියේ කුලයේ බෝග වලට බහුලව වැළඳෙන රෝගයක් නම් කරන්න.

III. a) රසායනික පළිබෝධ නාශක භාවිතයේදී අනුගමනය කළ යුතු නිවැරදි පිළිවෙත් 02 ක් හඳුන්වන්න.
b) පරිසර හිතකාමී පළිබෝධනාශකයක් පිළියෙල කරගන්නා අයුරු කෙටියෙන් විස්තර කරන්න.

04. ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල උචිත පාරිසරික තත්ව හා පාංශු තත්ව යටතේ සාර්ථකව වී වගා කළ හැකිය.

I. a) වී වගාව දියුණු කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබෙන ආකාර 04 ක් ලියන්න.
   b) ශ්‍රී ලංකාවේ දැනට වගාකරනු ලබන වැඩි දියුණු කරන ලද වී ප්‍රභේද 02 ක් හඳුන්වන්න.
   c) වී අභිජනනයේදී සළකා බලනු ලබන මූලික කරුණු 02ක් දක්වන්න.

II. a) වැඩි දියුණු කළ වී ප්‍රභේද වගා කිරිමේදී ඇතිවන ගැටලු 02 ක් සඳහන් කරන්න.
    b) එම ගැටලු තත්වය මඟහරවා ගැනීමට ගතහැකි ක්‍රියා මාර්ගයක් යෝජනා කරන්න.

III. a) වී වගාවේදී මඩක්‍රමයට හෙවත් තෙත් ක්‍රමයට බිම් සැකසීම පියවර කිහිපයකින් සිදුකරනු ලබයි. එම පියවර අනුපිළිවෙළින් දක්වන්න.
     b) වී වගාවේ වල්පැළ පාලනය කළහැකි ආකාර 02ක් ලියන්න.

05. බෝග වගාවේදී ප්‍රශස්ත අස්වැන්නක් ලබාගැනීම මෙන්ම ඉහළ ගුණාත්මයෙන් යුත් අස්වනු ලබා ගැනීමට නම් වඩාත් උචිත පාරිසරික සාධක ලබාදිය යුතුය.

I. a) බෝග වගාවේදී වැදගත්වන දේශගුණික සාධක 02 ක් නම් කරන්න.
   b) ඉහත සඳහන් කළ දේශගුණික සාධක මැනීම සඳහා භාවිත කරන උපකරණ 02 ක් පිළිවෙළින් ලියන්න.

II. a) වාර්ෂික වර්ෂාපතනයේ ප්‍රමාණය මෙන්ම ව්‍යාප්තියද සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාව වෙන්කර ඇති ප්‍රධාන දේශගුණික කලාප දක්වන්න.
    b) කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයේ ඇති වැදගත්කම් 02 ක් හඳුන්වන්න.

III. a) විවිධ ප්‍රදේශවල පරිසර උෂ්ණත්ව එකිනෙකින් වෙනස්වේ. මෙම වෙනස්වීම කෙරෙහි බලපාන සාධක 02ක් සඳහන් කරන්න.
     b) බෝග වගාවට උෂ්ණත්වයේ ඇති හිතකර බලපෑම් 02 ක් ලියන්න.

06. සාර්ථක බෝග වගාවන් සඳහා රෝපණ ද්‍රව්‍ය ලබාගැනීමේදී රෝපණයට සුදුසු වර්ධක කොටස් මෙන්ම ගන්නා බීජවලද මනා ප්‍රමිතියක් පැවතිය යුතුය.

I. a) ශාක ප්‍රචාරණය සඳහා භාවිත කරන ප්‍රධාන ක්‍රම 02 ක නම් කරන්න.
   b) බීජයක ජීව්‍යතාව යන්න පැහැදිලි කරන්න.

II. a) බීජ සුප්තතාව යන්න නිර්වචනය කරන්න.
    b) බීජ සුප්තතාව ඇතිවීමට බලපාන සාධක 04 ක් දක්වන්න.

III. a) අතුබැඳීම යනු කුමක්ද?
     b) සංයුක්ත අතුබැඳීම රූප සටහන් මගින් පැහැදිලි කරන්න.

07. වර්තමානයේ හේන්ගොවිතැනින් ක්‍රමයෙන් ඉවත් වෙමින් නූතන වගා රටා විධි අනුගමන කරමින් ඒකීය භූමියකින වැඩි ඵලදාවක් ලබැගැනීම සඳහා ගොවීහු වැඩි නැඹුරුතාවක් දක්වති.

I. a) හේන් ගොවිතැනේ අවාසි 04ක් නම් කරන්න.
   b) හේන් ගොවිතැනෙහි විශේෂ ලක්ෂණ 02 ක් දක්වන්න.

II. a) සමෝධානිත ගොවිතැන් ක්‍රමය හඳුන්වන්න.
    b) එහි අහිතකර ලක්ෂණ 02ක් ලියන්න.

III. කඩින් කඩ වගා ක්‍රමය දින දර්ශනයක් මගින් පැහැදිලි කරන්න.

පළමු වාර පරීක්ෂණය - 2018
කෘෂි හා ආහාර තාක්ෂණය - 11- ශ්‍රේණිය

පිළිතුරු පත්‍රය

## I - කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 11 | 2 | 21 | 3 | 31 | 2 |
| 2 | 2 | 12 | 1 | 22 | 2 | 32 | 3 |
| 3 | 1 | 13 | 1 | 23 | 3 | 33 | 1 |
| 4 | 3 | 14 | 3 | 24 | 1 | 34 | 2 |
| 5 | 2 | 15 | 2 | 25 | 2 | 35 | 1 |
| 6 | 1 | 16 | 2 | 26 | 2 | 36 | 3 |
| 7 | 3 | 17 | 4 | 27 | 2 | 37 | 3 |
| 8 | 1 | 18 | 3 | 28 | 1 | 38 | 2 |
| 9 | 4 | 19 | 3 | 29 | 3 | 39 | 3 |
| 10 | 2 | 20 | 1 | 30 | 2 | 40 | 4 |

## II - කොටස

01. I. උදැල්ල මෝල්බෝඩ් නගුල 1 × 2 ලකුණු 02
II. මිරිස්, බටු කරවිල, පතෝල 1 × 2 ලකුණු 02
III. දිග 3m, පළල 1m - 1 × 2 ලකුණු 02
IV. මැටි එකතු කිරීම, කාබනික ද්‍රව්‍ය එකතු කිරීම 1 × 2 ලකුණු 02
V. ගස් ඉදිරී වැටීම ජල වහනය වේගවත්ව සිදුවීම
අධික ලෙස ඛාදනය සිදුවීම 1 × 2 ලකුණු 02
VI. ගොළුබෙල්ලා, හංගොල්ලා, මයිටාවන් 1 × 2 ලකුණු 02
VII. පස ජීවානුහරණය රෝගී ශාක කොටස් පුළුස්සා විනාශ කිරීම 1 × 2 ලකුණු 02
(වෙනත් අදාළ පිළිතුරු ඇත්නම් ලකුණු ලබාදෙන්න.)
VIII. කොහුබත්, පිදුරු, දහයියා 1 × 2 ලකුණු 02
IX. තෙතමනය ආරක්ෂාවීම
වල්පැළ මතුවීම පාලනය
බීජ ප්‍රරෝහණයට අවශ්‍ය උෂ්ණත්වය ලබාදීම 1 × 2 ලකුණු 02
X. පොල්ලෙලි බඳුන්
කෙසෙල් පට්ටා බඳුන් 1 × 2 ලකුණු 02

02.
I. a) ★ අඩු වියදමකින් ගුණාත්මයෙන් ඉහළ ජලය ලබාගත හැකිවීම.
★ ගොවිතැන් කටයුතු සඳහා
★ ගෘහස්ථ පරිභෝජනය 1/2 × 2 ලකුණු 01
b) ★ බිංදු ජලසම්පාදනය 1 × 1 ලකුණු 01
c) ★ ජල සම්පාදන කාර්යක්ෂමතාව වැඩියි.
★ බෑවුම් සහිත ඉඩම් වලටද සුදුසුයි
(වෙනත් අදාළ වූ කරුණු ඇත්නම් ලකුණු ලබාදෙන්න) 1/2 × 2 ලකුණු 01
II. a) ★ උත්ස්වේදනය ★ පෘෂ්ඨීය අපධාවය
★ වාෂ්පීකරණය ★ වැස්සීම 1 × 2 ලකුණු 02
b) ★ කාබනික ද්‍රව්‍ය එකතු කිරීම
★ වසුන් යෙදීම
(වෙනත් අදාළ වූ කරුණු ඇත්නම් ලකුණු ලබාදෙන්න) 1 × 2 ලකුණු 02
III. a) ★ පාංශු වාතනය දුර්වලවීම
★ නිර්වායු ජීවී ගහනය වැඩි නිසා මීතේන් වැනි විෂවායු නිෂ්පාදනය
(වෙනත් අදාළ වූ කරුණු ඇත්නම් ලකුණු ලබාදෙන්න) 1 × 2 ලකුණු 02
b) ★ වැසි ජල සංරක්ෂණ ටැංකි 1 × 1 ලකුණු 01

03.
I. a) ★ මිනිසාට හෝ මිනිසා විසින් වගාකරනු ලබන බෝග වලට හෝ ඇතිකරනු ලබන සතුන්ට හෝ පරිහරණය කරන ද්‍රව්‍ය වලට හෝ හානි පමුණුවන ඕනෑම ජීවියෙකි. 1 × 2 ලකුණු 02
b) ★ සීඝ්‍රයෙන් පැතිරේ
★ අහිතකර තත්ව යටතේ හොඳින් වර්ධනය වේ.
(වෙනත් අදාළ වූ වෙනත් පිළිතුරු ඇත්නම් ලකුණු ලබාදෙන්න) 1/2 × 2 ලකුණු 01
c) ★ගඳපාන ★යෝධ නිදිකුම්බා ★පාතීනියම් 1/2 × 2 ලකුණු 01

II. a) ★පුල්ලි ඇතිවීම ★ මැලවීම ★ ගැටිති ඇතිවීම
★අංගමාරය ★ මෘදු කුණුවීම ★ කබලු ඇතිවීම 1/2 × 4 ලකුණු 02
b) ★බැක්ටීරියා හිටුමැරීම ලකුණු 01
III. a) ★සුදුසු පළිබෝධ නාශක තෝරා ගැනීම
★ ප්‍රවේශමෙන් ප්‍රවාහනය
★ කුඩා ළමුන්ට ගත නොහැකි ලෙස ගබඩා කිරීම
(වෙනත් අදාළ වූ කරුණු ඇත්නම් ලකුණු ලබාදෙන්න) 1/2 × 2 ලකුණු 01
b) ★ විස්තරයට ලකුණු 02

04.
I. a) ★පොහොර සහනාධාර ලබාදීම
★වගා රක්ෂණ ක්‍රම
★වගා ණය ලබාදීම
★ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය
(වෙනත් අදාළ වූ කරුණු ඇත්නම් ලකුණු ලබාදෙන්න) 1/2 × 4 ලකුණු 02
b) ★B.G 300, B.W. 351, B.G. 450, H.4 1/2 × 2 ලකුණු 01
c) ★වැඩි අස්වැන්න
★ඇද වැටීමට ඔරොත්තු දීම
★මධ්‍යස්ථ පඳුරු දැමීම
(වෙනත් අදාළ වූ කරුණු ඇත්නම් ලකුණු ලබාදෙන්න) 1/2 × 2 ලකුණු 01
II. a) ★යෙදවුම් සඳහා විශාල විදේශ විනිමයක් වැයවීම.
★අධික රසායන ද්‍රව්‍ය භාවිතය නිසා පාරිසරික, සෞඛ්‍ය හා සාමාජීය ගැටලු ඇතිවීම
★පළිබෝධ හානි වැඩිවීම 1 × 2 ලකුණු 02
b) ★නැවත පාරම්පරික වී ප්‍රභේද වගා කිරීම සඳහා ගොවීන් යොමු කිරීම ලකුණු 01
III. a) 1 මූලික බිම් සැකසීම
2 දෙවන හීය
3 නියර මඩ බැඳීම
4 ක්ෂේත්‍රය මඩ කිරීම හා පෝරු ගෑම 1/2 × 4 ලකුණු 02
b) ★වල්පැළ බීජවලින් තොර ගුණාත්මක බිත්තර වී භාවිතය
★ ඇළ වේළි නියරවල් පිරිසිදු කිරීම
(වෙනත් අදාළ වූ කරුණු ඇත්නම් ලකුණු ලබාදෙන්න) 1/2 × 2 ලකුණු 01

05.
I. a) ★වර්ෂාපතනය
★ උෂ්ණත්වය
★ ආලෝකය
★ ආර්ද්‍රතාව
★ සුළඟ 1 × 2 ලකුණු 02
b) ★ වර්ෂාමානය
★ උෂ්ණත්වමානය
★ සූර්ය දීප්ත මානය
★ තෙත් හා වියලි බල්බ උෂ්ණත්වය
★ අනිලමානය 1/2 × 2 ලකුණු 01
II. a) ★ තෙත් කලාපය
★ අතරමැදි කලාපය
★ වියලි කලාපය 1 × 3 ලකුණු 03
b) ★දේශගුණික තත්ව සමාන වන ප්‍රදේශ දැන ගැනීමට හැකිවීම
★එම කලාප වලට සුදුසු බෝග නිර්දේශ කිරීමට හැකිවීම
(වෙනත් අදාළ වූ කරුණු ඇත්නම් ලකුණු ලබාදෙන්න) 1/2 × 2 ලකුණු 01
III. a) ★සමකයේ සිට ඇති දුර
★උච්චත්වය
★මුහුදේ සිට ඇති දුර ප්‍රමාණය
★වන ගහනය 1 × 2 ලකුණු 02
b) ★බීජ ප්‍රරෝහණය
★දඬු කැබලි මුල් ඇද්දවීම
★අල බෝගවල ආකන්ද ඇතිවීම
(වෙනත් අදාළ වූ කරුණු ඇත්නම් ලකුණු ලබාදෙන්න) 1/2 × 2 ලකුණු 01

06.

I. a) ★ ලිංගික ප්‍රචාරණය
★අලිංගික ප්‍රචාරණය 1 × 2 ලකුණු 02

b) ★ප්‍රරෝහණය වී නව ශාකයක් ඇති කිරීමට බීජයකට ඇති හැකියාව ලකුණු 01

II. a) ★ජීවී බීජයකට ප්‍රරෝහණය වීමට අවශ්‍ය සියලු සාධක (අභ්‍යන්තර හා බාහිර)ලැබී තිබියදීත් එය ප්‍රරෝහණය නොවීම ලකුණු 02

b)
★ බීජාවරණය ජලයට හා වාතයට අපාරගම්‍යවීම
★ බීජාවරණයඝනව පැවතීම
★ නිශේධක ද්‍රව්‍ය තිබීම
★ කළලය පරිණත නොවීම
★ කළලය අක්‍රියව පැවතීම
(වෙනත් අදාළ වූ කරුණු ඇත්නම් ලකුණු ලබාදෙන්න) 1/2 × 4 ලකුණු 02

III. a) ★දඬු කැබලි මව් ශාකයට සම්බන්ධව තිබිය දීම මුල් අද්දවාගැනීම ලකුණු 02

b) ★රූප සටහන ඇඳ නම් කිරීම ලකුණු 01

07.

I. a)
★පාංශු ඛාදනය සිදුවීම
★කාබනික ද්‍රව්‍ය විනාශවීම
★ වනාන්තර විනාශ වීම
★ ස්වාභාවික සෞන්දර්ය විනාශවීම
(වෙනත් අදාළ වූ කරුණු ඇත්නම් ලකුණු ලබාදෙන්න) 1/2 × 4 ලකුණු 02

b)
★ජලය හා පොහොර යෙදීමක් නැත
★කෘෂි රසායන භාවිත නොකරයි
★බිම් සැකසීමක් නැත
(වෙනත් අදාළ වූ කරුණු ඇත්නම් ලකුණු ලබාදෙන්න) 1/2 × 2 ලකුණු 01

II. a) ★එක් ව්‍යවසායක අතුරුඵල වෙනත් ව්‍යවසායකයක අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින් එකම භූමියක් තුළ බෝග වගාව, සත්ව පාලනය, බල ශක්තිය නිෂ්පාදනය සහ පොහොර නිෂ්පාදනය වැනි ක්‍රියාවලි ඒකාබද්ධව සිදුකිරීම ලකුණු 02

b)
★කුඩා ඉඩම් සඳහා යොදා ගැනීම අපහසුය
★මූලික වියදම් හා යෙදවුම් වැඩිය
(වෙනත් අදාළ වූ කරුණු ඇත්නම් ලකුණු ලබාදෙන්න) 1 × 2 ලකුණු 02

III. කඩින් කඩ වගාවේ දින දර්ශනය ඇතුළත් විය යුතුයි. ලකුණු 03